WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்கள மொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

**2018.12.04 / 0830 - 1140**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** ඔහු අදහස් ප්‍රකාශ කළේ **උගුරට හොරා බෙහෙත් කන්නා සේ** ය.
(1) කිසිවකුට නොදැනෙන්නාක් මෙන්
(2) උගුරට නොදැනෙන පරිදි බෙහෙත් ගිලින්නාක් සේ
(3) අනුන්ගේ බලකිරීම ඉටු කරන්නාක් මෙන්
(4) යමක් වසන් කරන්නාක් මෙන්

**2.** **අල්ලේ පැළවෙන බොරු** කීමෙන් සමහරු තම කීර්තිනාමය නැති කර ගනිති.
(1) කෙනකු රවටන බොරු බස් (2) කෙසේ වත් විශ්වාස කළ නොහැකි දේ
(3) ඇදහීමට තරමක් දුෂ්කර කරුණු (4) අල්ල මත පැළවෙන දේ

**3.** කියන දෙයක් **වහෙන් ඔරෝ** නො කියා කෙළින් කියන්න.
(1) සෘජු ආකාරයෙන් (2) ඔහෙන් වරෝ යන ලෙසින්
(3) ව්‍යංග්‍යයෙන් (4) කෙනකුට නොදැනෙන අයුරින්

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** තාරකා විද්‍යාඥයෝ උපකරණ භාවිතයෙන් ග්‍රහවස්තුන්ගේ පිහිටීම ...................... කර අනාවැකි පළ කරති.
(1) පරීක්ෂණය (2) නිරීක්ෂණය (3) අධීක්ෂණය (4) අන්වේෂණය

**5.** භාෂාවක අර්ථ ප්‍රකට කිරීමෙහි ලා ............................ ඉතා වැදගත් ය.
(1) ශබ්දෝච්චාරණය (2) සුබෝච්චාරණය (3) සාවද්‍යෝච්චාරණය (4) අනුච්චාරණය

**6.** අධ්‍යාපනයෙහි දී .................... හිමි විය යුත්තේ ප්‍රමාණාත්මකභාවයට නො ව ගුණාත්මකභාවයට ය.
(1) ප්‍රමුඛත්වය (2) ප්‍රබලත්වය (3) යෝග්‍යත්වය (4) උචිතත්වය

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

7. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) අනුරාධපුරය, අවිස්සාවේල්ල, අම්පාර, අඹේවෙල
(2) රත්නපුරය, රන්ටැඹේ, රන්දෙණිගල, රතුපස්වල
(3) කඩුවෙල, කතරගම, කන්කසන්තුරේ, කල්මුනේ
(4) ගල්කිස්ස, ගල්ගමුව, ගම්පොළ, ගණේමුල්ල

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) වීරෝදාර, මර්දනය, ප්‍රතිඵල, ප්‍රස්තාවනාව
(2) දර්ශන, විමර්ශණ, සර්ෂණ, තීක්ෂ්ණ
(3) නර්ථන, නිශ්ශංකමල්ල, ලංකේශ්වර, වර්ධනය
(4) නින්දාලාප, කර්ණරසායන, සංශරණය, ප්‍රතිලාභ

9. එක් එක් වචනයේ **දෙවෙනි අකුරෙහි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, ඇදය** හා **ගැට ඇලපිල්ල** අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) අභූත, විවෘත, අලියා, නිවැරදි
(2) අලියා, අභූත, විවෘත, නිවැරදි
(3) විවෘත, අලියා, නිවැරදි, අභූත
(4) අලියා, අභූත, නිවැරදි, විවෘත

10. 'රතුපුල්' යන්න අයත් වන්නේ,
(1) අන්‍යාර්ථ සමාසයට ය.
(2) විශේෂණ සමාසයට ය.
(3) විභක්ති සමාසයට ය.
(4) අව්‍යය සමාසයට ය.

11. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) දරුවෙක්, මම, දෙවඟනක්, ලේඛකයෝ
(2) ළමයින්, මිනිසා, වඳුරෙක්, ශිෂ්‍යාවක
(3) මා, බඹකු, නයෙක්, ගුරුවරු
(4) ධාවකයෙක්, නිළියක්, තා, දිවියෙක්

12. 'ප්‍රසංග + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) ප්‍රාසාංගික (2) ප්‍රසාංගික (3) ප්‍රාසංගික (4) ප්‍රසංගික

13. "භයානක වග වලස් ආදීහු වනයෙහි ඔබ-මොබ සැරි සරති." යන වාක්‍යයේ 'වනයෙහි' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) සම්බන්ධ (2) ආධාර (3) සම්ප්‍රදාන (4) කර්ම

● අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

14. වත්මන් තරුණ පරපුරට සාහිත්‍ය මූලධර්ම පිළිබඳ **පෑවුල** අවබෝධයක් නැත.
(1) ප්‍රමාණවත් (2) පරිණත (3) පළල් (4) ගැඹුරු

15. යුද්ධයෙන් දිනීමට නම් සතුරු සේනා **මුලෝත්පාටනය** කළ යුතු ය.
(1) ඝාතනය
(2) මුලිනුපුටා දැමීම
(3) උදුරා දැමීම
(4) ඡේදනය

WWW.OLEVELAPI.COM

16. 'ව' යනු **දන්තෞෂ්ඨජ** අක්ෂරයකි.
(1) දත්වලින් හටගන්නා
(2) තොල්වලින් හටගන්නා
(3) දත්වලින් හා බොටුවෙන් හටගන්නා
(4) දත්වලින් හා තොල්වලින් හටගන්නා

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) තද්ධිත - සිරිමත්, දිරිමත්, කුල්මත්, ඉසුරුමත්
(2) සන්ධි - නිලුපුල්, වමත, දබරැඟිල්ල, පුරඟන
(3) කෘදන්ත - නැටිලි, පැනිලි, දිවිලි, විමසිලි
(4) විධික්‍රියා - බලව, කරව්, කියග, දුව

18. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නො පවත්නා** පද පේළිය තෝරන්න.
(1) ලෝපය, ආදේශය, ආගමය, දීර්ඝය
(2) කණ්ඨජ, අණ්ඩජ, තාලුජ, මූර්ධජ
(3) ත්‍රිකෝණය, චතුරස්‍රය, රොම්බසය, ෂඩාස්‍රය
(4) පුස්තකය, පරිච්ඡේදය, ඡේදය, වාක්‍යය

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**19.** එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) කත - කාන්තාව, සියපත - නෙලුම, පර්වතය - ගිරි, නුවණ - ඇස
(2) කුරුල්ලා - විහඟ, ශාස්ත්‍රය - ධර්මය, වත - මුහුණ, මත්ස්‍යයා - මසු
(3) වෙළෙන්දා - වාණිජ, රථය - රිය, දෙවියා - අසුර, අත - බාහු
(4) වෘක්ෂය - ගස, මල - පුෂ්පය, අලුයම - ප්‍රභාතය, හිස - ශීර්ෂය

**20.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) භූමි - පොළොව, පයවි, මිහි, ධරණි
(2) සූර්යයා - රවි, හිරු, දිනකර, දිනිඳු
(3) මුහුද - සයුර, ජලනිධි, සමුද්‍රය, කරදිය
(4) සුළඟ - වායු, නල, වාතය, පවන

**21.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) ප්‍රබුද්ධ - සුප්‍රබුද්ධ
(2) ආගමන - විගමන
(3) ශත්‍රු - මිත්‍ර
(4) උක්ත - අනුක්ත

**22.** **මිශ්‍ර ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) සංචාරකයා සමින් මැසූ පාවහන් පැළඳ ගමන් කළේ ය.
(2) අසරණ දරුවා සිඟා ගත් බත් කමින් සිටියේ ය.
(3) බන්ධනාගාර නිලධාරියා සිරකරුවා යකඩ දමින් බැඳ එතැනට ගෙන ආවේ ය.
(4) දුටුගැමුණු රජතුමා 'ස්වර්ණමාලි' නමින් මහාථූපය නම් කළේ ය.

**23.** **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'රේඵය' වෙනුවට 'ර්' යන්න යෙදිය හැකි ය.
(2) 'අසම්භාව්‍ය ක්‍රියාව' කාලාර්ථයේ මෙන් ම අනියමාර්ථයේ ද යෙදේ.
(3) 'නටමි' යනු වර්තමාන කාල, උත්තම පුරුෂ ඒක වචන ආඛ්‍යාත පදයකි.
(4) 'ඓතිහාසික' යන වචනය මෙන් ම 'ඓෙතිහාසික' යන්න ද නිවැරදි ය.

**24.** දන්තජ අක්ෂර පමණක් අන්තර්ගත වචනය තෝරන්න.
(1) සැනසුම (2) ලස්සන (3) දවස (4) තනතුර

**25.** පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන ග්‍රන්ථ කර්තෘ නාමය ඇතුළත් වරණය තෝරන්න.
(1) ද්‍යා ච වි ව ති න් ක්‍ර
(2) ගි ල අ ව න කු න් ය
(3) ර් සේ ධ න ම
(4) ගෝ කු එ මී රු

● අංක **26** හා **27** ප්‍රශ්න යටතේ දී ඇති **ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන** අදහස සහිත වරණය තෝරන්න.

**26.** වඳින්න ගිය දේවාලෙ හිස මත කඩා වැටුණා වාගේ
(1) දේවාලය දිරා ගොස් තිබූ නිසා හිස මත කඩා වැටීම
(2) යම් පිහිටක් බලාපොරොත්තුවෙන් ගිය විට එය ඉටු නොවීම
(3) එක් කරදරයක් අතරතුර තවත් කරදරයකට මුහුණ දීම
(4) පිහිටක් බලාපොරොත්තුවෙන් ගිය විට තවත් විපතකට මුහුණ පෑම

**27.** ඉබ්බන්ගෙන් පිහාටු ගන්නවා වාගේ
(1) ලබා ගත නොහැකි දෙයකට බලාපොරොත්තු තැබීම
(2) ඉතා අමාරුවෙන් යමක් ලබා ගැනීම
(3) නැති දෙයක් කෙසේ හෝ ලබා ගැනීම
(4) සඟවාගෙන තිබෙන දෙයක් ඉල්ලා ගැනීම

**28.** A - දැස - ස්වරාදේශ සන්ධිය
B - පොල්ලත්ත - පරරූප සන්ධිය
C - මලසුන - ස්වර සන්ධිය
D - මුනිතුමා - පූර්ව ස්වර ලෝප සන්ධිය

A, B, C, D යෙදුම් අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

[හතරවැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

● අංක **29** හා **30** යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) මම ද නංගී ද මල්ලී ද ගමට යති.
(2) මම ද නංගී ද මල්ලී ද ගමට යමු.
(3) මම ද නංගී ද මල්ලී ද ගමට යයි.
(4) නංගී ද මල්ලී ද මම ද ගමට යමි.

**30.** (1) ගායකයෝ ගී නො ගයති'යි පිරිස හූ කීහ.
(2) දරුවන් පිණිස යමක් කරන්නැ'යි නගරාධිපතිතුමා ඉල්ලා සිටියහ.
(3) සියලු ජාතීන් සාමයෙන් ජීවත් වෙත්වා!
(4) එදිරිවීර සරච්චන්ද්‍ර දක්ෂ නාට්‍යකරුවකු මෙන් ම ප්‍රකට නවකථා රචකයෙක් ද විය.

**31.** A - පොදු ජනයාගේ දැන ගැනීම .................... මේ පත්‍රිකාව බෙදා හරිමි.
B - ගුරුවරුන් එතැනට පැමිණි ...................... ශිෂ්‍යයෝ අරගලය නතර කළහ.
C - ගුත්තිල පඬිතුමා, මූසිල දරුවකු .................... රැක බලා ගත්තේ ය.
D - කොග්ගල මහා ප්‍රාඥයා ...................... මාර්ටින් වික්‍රමසිංහ ගම්පෙරළිය රචනා කළේ ය.
ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

E - මෙන් F - උදෙසා G - හෙවත් H - නිසා

(1) H, E, F, G (2) F, E, G, H (3) F, H, E, G (4) F, E, H, G

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මං ඉඳ හිට වෙල පැත්තට යනවා"
(1) මම කලාතුරකින් කුඹුර දෙසට යමි.
(2) මම බොහෝ කලකට පසු කුඹුරට යමි.
(3) මම ඉඳ හිට කුඹුර දෙසට ගොස් පැමිණෙමි.
(4) මම මාස කිහිපයකට පසු ව කුඹුරට යමි.

**33.** 'හඳ සහ නිව්යෝර්ක් නුවර' නමැති පද්‍ය නිර්මාණය
(1) ගුණදාස අමරසේකරගේ ය.
(2) මහගම සේකරගේ ය.
(3) විමල් දිසානායකගේ ය.
(4) පරාක්‍රම කොඩිතුවක්කුගේ ය.

**34.** **රූපකයක් රහිත** වරණය තෝරන්න.
(1) රුවින දිලෙන අබරණ කැලුම ගත යෙදී
(2) කුරා කුහුඹු මිනිස් යන්ත්‍ර
(3) මී දේ දුව ඉසට නැඟු ව - ඉඳුනිල් මිණි සේසතක් ය
(4) මිහිලිය නළලේ අංජන තිලකේ

**35.** "හිරි ඔතප් ලද නියාවට කාරණ පෑවා සේ වාලධිය අමුඩු හස්සෙහි ගන්වා" යන පාඨයෙහි 'වාලධිය' යන වචනයේ අර්ථය කුමක් ද?
(1) පසු පස කකුල
(2) කන්දෙක
(3) අමුඩය
(4) වල්ගය

WWW.OLEVELAPI.COM

**36.** පහත සඳහන් කවියේ තුන්වැනි පදය තෝරන්න.

"පෙර විරුවන් ඔබගෙ පුතේ
ඉදි කළ වැව් බලන් පුතේ
..................................
ඒ මහ වැව් බැඳුණෙ පුතේ"

(1) ඇ උරුමය ඇතිව සිතේ
(2) ඇතේ සවියෙනුයි පුතේ
(3) සුරුවිරුකම් ඔබට ඇතේ
(4) මවු බිම දෙස බලන් පුතේ

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**37.** "ඔන්න මං ගැටය කාලෙ නං නේරු අගමැතිතුමා ඉස්සරහ, මහ රැජින ඉස්සරහ, සියං කුමාරයා ඉස්සරහ නැටුං නටල ප්‍රශංසා ලබලා තියෙනවා" මේ සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?
(1) තල මල පිපිලා (2) හුණු වටයේ කතාව
(3) සිංහබාහු (4) ගුරුතරුව

**38.** හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'වාංපතුල්' යනු,
(1) මර උගුල් ය. (2) වඳුරන්ගේ පාදයන් ය.
(3) පාවහන් ය. (4) සතුන්ගේ හම්පොතු ය.

**39.**
"උදුළ සොම් කැලුම් නිසයුරු හිමි පුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවන් තල සිරි යහන නිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙත තුරුවැළ"
යන කවියෙන් කියැවෙන්නේ,
(1) වන වැනුමක් ගැන ය. (2) හිරු බැස යන අවස්ථාවක් ගැන ය.
(3) රජකුගේ සිරි යහනක් ගැන ය. (4) නිශා වර්ණනයක් ගැන ය.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.
"මතු පිටින් පෙනෙන වාච්‍යාර්ථය නොව ව්‍යංග්‍යාර්ථය ද අවබෝධ කළ යුතු ය. බසේ බුද්ධිගෝචර වන කොටස පමණක් නො ව හෘදයගෝචර වන කොටස ද දත යුතු ය."
(1) වචනාර්ථය හා ව්‍යංග්‍යයෙන් කියවෙන අර්ථ අවබෝධ කළ යුතු අතර හදවතට හා බුද්ධියට ගෝචර වන කොටස් දැන ගැනීම ප්‍රමාණවත් ය.
(2) මතු පිටින් පෙනෙන අර්ථ හා ව්‍යංග්‍යයෙන් කියැවෙන කොටස් අවබෝධ කළ යුතු අතර බුද්ධිගෝචර හා හෘදයගෝචර කොටස් දැන ගත යුතු ය.
(3) වචනයේ මතු පිට අර්ථය මෙන් ම ව්‍යංග්‍යයෙන් කියැවෙන අර්ථය ද බුද්ධියට ගොදුරු වන කොටස මෙන් ම හදවතට ගොදුරු වන කොටස ද අවබෝධ කර ගත යුතු ය.
(4) මතු පිටින් පෙනෙන වචනාර්ථය අවබෝධ කළ යුතු අතර බුද්ධිගෝචර හා හෘදයගෝචර කොටස් දැන ගත යුතු ය.

* *

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....